# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report

# 2014

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව -
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
தேசிய திட்டமிடல் திணைக்களம்- நிதி திட்டமிடல் அமைச்சு
Department of National Planning – Ministry of Finance and Planning

**කාර්ය සාධන වාර්තාව - 2014**

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**

**පිටු අංකය**


| | | | |
|---|---|---|---|
| **1.** | දැක්ම, මෙහෙවර, කාර්යයන් සහ වගකීම් | | **03** |
| **2.** | දෙපාර්තමේන්තුවේ ඒකක සහ අංශ | | **04** |
| **3.** | ආංශික කාර්යය සාධනය | | **05** |
| | **3.1** | කෘෂිකර්ම හා වාරිමාර්ග | **05** |
| | **3.2** | ආර්ථික යටිතල පහසුකම් හා පරිසර | **09** |
| | **3.3** | කර්මාන්ත, තැපැල් හා විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ හා විද්‍යා හා තාක්ෂණ | **15** |
| | **3.4** | සෞඛ්‍ය, සංස්කෘතික, ජාතික උරුමයන්, ජාතික ඒකාබද්ධතා | **18** |
| | **3.5** | අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන | **19** |
| | **3.6** | සාර්ව ආර්ථික | **22** |
| | **3.7** | ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ | **23** |
| | **3.8** | රාජ්‍ය කළමනාකරණය | **24** |
| **4.** | සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය | | **25** |
| **5.** | මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය | | **26** |
| **6.** | මූල්‍ය කාර්ය සාධනය | | **33** |

## 01. දැක්ම,මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

**දැක්ම**

දැයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශනය හා පහසුකම් සපයන්නා වීම

**මෙහෙවර**

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම.

**ප්‍රධාන කාර්යයන්**

**(i)** මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන සැලසුම්, රාජ්‍ය අයෝජන වැඩ සටහන් සම්පාදනය කිරීම සහ ආංශික සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම සඳහා රේඛීය ආයතන වලට සහාය වීම.

**(ii)** සාර්ව ආර්ථික රාමුව සහ උපාය මාර්ග වැඩි දියුණු කිරීම.

**(iii)** ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති, අදාළ උපාය මාර්ග සහ වැඩසටහන් විමසුමට ලක්කිරීම සහ ව්‍යාපෘති ඇගයීම.

**(iv)** වාර්ෂික ප්‍රාග්ධන අයවැය සැකසීම සඳහා තාක්ෂණික සහාය සැපයීම.

**(v)** ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති ලේඛනය සකස් කිරීම හා යාවත් කාලීන කිරීම.

**(vi)** ව්‍යාපෘති සැලසුම්කරණය හා ප්‍රතිපත්තිසම්පාදනයට අදාළව දෙපාර්තමේන්තුව වෙත පවරණු ලබන විශේෂ පැවරුම් ක්‍රියාත්මක කිරීම.

## 02. දෙපාර්තමේන්තුවේ ඒකක හා අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාර්ය කාර්යක්ෂමව ඉටුකරලීම පිණිස දෙපාර්තමේන්තුව අංශ 08 කට වෙන් කර ඇත. එම අංශ 08 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ 26 කට වෙන් කර ඇත.එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් සිදු කරනු ලබන ඒ ඒ අංශයේ ප්‍රතිපත්ති සැලසුම් නිර්මාණය හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

**<u>දෙපාර්තමේන්තුවේ අංශ</u>**

**(i)** කෘෂිකර්ම හා වාරිමාර්ග

**(ii)** ආර්ථික යටිතල පහසුකම් හා පරිසර

**(iii)** කර්මාන්ත, තැපැල් හා විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ හා විද්‍යා හා තාක්ෂණ

**(iv)** සෞඛ්‍ය, සංස්කෘතික, ජාතික උරුමයන්, ජාතික ඒකාබද්ධතා

**(v)** අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන

**(vi)** සාර්ව ආර්ථික

**(vii)** ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ

**(viii)** රාජ්‍ය කළමනාකරණ

මීට අමතරව දෙපාර්තමේන්තුවේ කාර්යයන් පවත්වාගෙන යාම සඳහා පහත අංශ 3 ද ඇත.

**1.** සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය

**2.** පරිපාලන අංශය

**3.** මූල්‍ය අංශය

## 03. ආංශික කාර්ය සාධනය

### 3.1 කෘෂිකර්ම හා වාරි මාර්ග අංශය

**කෘෂිකර්ම :-**

රටේ ආර්ථිකයේ කොඳු නාරටිය වන් කෘෂිකර්මාන්තය මුළු ජනගහනයෙන් සියයට 70 කට වඩා වැඩි පිරිසකට ජීවනෝපාය මාර්ගයන් සලසයි. නිෂ්පාදන හා සේවා අංශ වල සීඝ්‍ර වර්ධනයත් සමඟ දළ දේශීය නිෂ්පාදනය සඳහා කෘෂිකර්ම අංශයේ දායකත්වය අඩු වීමක් සිදු වූවද එය ආර්ථිකයේ අඩිතාලම ලෙස අඛණ්ඩව පවතී.

කෘෂිකාර්මික බෝග වල නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩි කිරීම සඳහා ගොවීන් දිරි ගැන්වීමේ අරමුණින් දිරි ගැන්වීමේ යෝජනා ක්‍රම රාශියක් ක්‍රියාත්මක කරනු ලැබේ. පොහොර සහනාධාරය යටතේ සමස්ථ පොහොර සඳහා වන වියදමින් සියයට 90 ක් වී වගාව සඳහා ද සියයට 65 ක් අනෙකුත් බෝග වගාවන් සඳහාද රජය විසින් දරණු ලැබේ. පොහොර සහනාධාරය සඳහා 2014 වර්ෂයේදී රු. බිලියන 35 ක් වෙන් කරන ලදී. ඊට අමතරව කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරි ගැන්වීම සඳහා රජය විසින් රු. මිලියන 300 ක් 2014 වර්ෂය සඳහා වෙන් කරන ලදී.

**විශේෂ වැඩසටහන්**

- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2013 වාර්ෂික වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සහ සංඛ්‍යා ලේඛන ලබා දීම.
- ‘‘කෘෂිකාර්මික බෝග වල සාපේක්ෂ ප්‍රයෝජනය’’ සම්බන්ධයෙන් වාර්තාවක් සැකසීම.
- ‘‘කුරුණෑගල සහ ගම්පහ දිස්ත්‍රික් වල අපනයන කෘෂිකාර්මාන්තය සහ කිරි නිෂ්පාදන අංශය වැඩි දියුණු කිරීම මඟින් සමෝධානික ග්‍රාමීය සංවර්ධනය’’ යන සංකල්ප පත්‍රිකාව සැකසීම.
- ව්‍යාපෘති යෝජනා 33 ක් ඇගයීම සහ ඒ සඳහා වන නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හෝ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 23 ක් සඳහා නිරීක්ෂණය ඉදිරිපත් කිරීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම.

## පශු සම්පත් :-

පශු සම්පත් අංශය ප්‍රධාන වශයෙන් කිරි ගව, කුකුළු, සූකර සහ එළුවන් යන උප අංශවලින් සමන්විතය. 2014 වසරේ මෙම අංශය සඳහා සමස්ත ආයෝජනය රුපියල් මිලියන 5,689ක් වූ අතර එයින් රුපියල් මිලියන 5,024ක් ප්‍රාග්ධන වියදම් ලෙස උසස් තත්වයේ සත්ව ප්‍රභේද නංවාලීම, සත්වරෝග නිවාරණ, ව්‍යාප්ති සේවා පුළුල් කිරීම, පශු සම්පත් ආශ්‍රිත පර්යේෂණ සහ ග්‍රාමීය ප්‍රජාව සංවර්ධනය සඳහා යොදවා ඇත. පශු සම්පත් අංශය සිදු කරනු ලබන කාර්යයන් පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන අතර ඒ සඳහා සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, සහ මිල්කෝ ආයතනය වැනි අනිකුත් ආයතනවල සහයෝගීතාව ලැබේ.

**විශේෂ ක්‍රියාකාරකම්**

- ව්‍යාපෘති වාර්තා 07 ක් විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ජාතික අය වැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජාසංවර්ධන අමාත්‍යාංශය විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 5ක් සඳහා නිරීක්ෂණ ලබාදීම.
- පශු සම්පත් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ "කිරි ගවයන් ආනයනය කිරීම " ව්‍යාපෘතියේ කමිටු සාකච්ඡා සඳහා සහභාගී වීම.
- නවසීලන්තය හා ශ්‍රී ලංකාව අතර පශු සම්පත් ක්ෂේත්‍රයේ පුහුණුවීම් ලබා දීම සම්බන්ධයෙන් වැඩසටහනක් සකස් කිරීම සඳහා අවශ්‍ය දායකත්වය එම රැස්වීම් වලට සහභාගී වෙමින් හා සංකල්ප සටහන් සැකසීම මගින් ලබා දීම.

## වාරිමාර්ග හා ඉඩම් :-

2014 වර්ෂයේ වාරිමාර්ග අංශය සඳහා රජයේ සමස්ත වියදම රු. බිලියන 46.29 ක් වූ අතර එම මුදලින් රු. බිලියන 42.37 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කරන ලදී. ජල සම්පත් සංවර්ධනය යටතේ නව ව්‍යාපෘති රැසක් මගින් කෘෂිකාර්මික හා වෙනත් ජල අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීමට අපේක්ෂා කෙරෙන අතර ඒ යටතේ ගිං/නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය, යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය සහ මහවැලි ජලය ආරක්ෂණය කිරීමේ ආයෝජන ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම සඳහා 2014 වර්ෂයේදි ප්‍රමුඛත්වය ලබා දී ඇත.

ඉඩම් අංශය සඳහා 2013 වර්ෂයේ රාජ්‍ය ආයෝජනය රුපියල් මිලියන 6,025 ක් වන අතර ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 2,514 ක් වැය කොට ඇත. රාජ්‍ය ආයෝජන අතර ඉඩම් හිමිකම් ඔප්පු වැඩසටහන (බිම් සවිය) - රු. මිලියන 445, රාජ්‍ය කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම - රු. මිලියන 1,646, උගත්පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම - රු.මිලියන 255 ඇතුළු අනෙකුත් සංවර්ධන වැඩසටහන් සඳහා රු. මිලියන 168 ක් ලෙස 2014 වර්ෂයේදී රාජ්‍ය ආයෝජන සිදුකොට ඇත.

**සිදුකරන ලද විශේෂ අධ්‍යයන**

2013 වර්ෂයේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ පසුබිම් සටහන් පරිච්ඡේදයේ වාරි අංශයේ සංවර්ධන වැඩසටහන් ඇතුළත් කොට ඇති "සංවර්ධනයේ නව යුගයක් කරා...." යන වාර්තාව පල කිරීම

**විශේෂ වැඩසටහන්**

1. වාරිමාර්ග අංශයේ 2005 – 2013 කාලපරිච්ඡේද තුළ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති වලින් දායක වූ යටිතල පහසුකම් ඇතුළත් වන සේ වත්කම් ලේඛනය සකස් කිරීම.

2. පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩපිළිවෙලට සමගාමීව, 2014 – 2016 කාලපරිච්ඡේද තුළ පුනරුත්ථාපනය කළ යුතු සුළු වාරිමාර්ග සැලැස්ම පිළියෙල කිරීම.

3. කිලිනොච්චි දිස්ත්‍රික්කයෙහි කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ සමෝධානික සංවර්ධන වැඩසටහන උතුරු පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග සහ පශු සම්පත් අමාත්‍යාංශය සහ අදාළ දෙපාර්තමේන්තු එක්ව සකස් කිරීම.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අවසන් කරන ලද වාරි අංශයට අයත් කාර්යයන්**

1. වාරි හා ඉඩම් අංශයේ ව්‍යාපෘති වාර්තා පිළිවෙලින් 18ක් හා 05ක් ලෙස ඇගයීමට ලක් කොට, අදාල නිරීක්ෂණ විදේශ සම්පත් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවලට ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම.

2. වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 10 කට අදාළ නිරීක්ෂණ අමාත්‍ය මණ්ඩලය වෙත ලබා දීම.

3. ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 04 කට අදාළ නිරීක්ෂණ අමාත්‍ය මණ්ඩලය වෙත ලබා දීම.

4. දේශගුණික විපර්යාස වලින් සිදුවන බලපෑම් අවම කිරීමේ වැඩසටහන යටතේ ගංඟාද්‍රෝණි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය යොමු කිරීමේ අනුදේශ පිළියෙල කිරීමට තාක්ෂණික සහාය ලබාදීමට කටයුතු කිරීම.

5. වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කරන ව්‍යාපෘතියේ අතිරේක මූල්‍යායනය සහ මහවැලි ජලය ආරක්ෂණ ආයෝජන වැඩසටහන සඳහා ව්‍යාපෘති වාර්තාව සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම.

6. මොරගහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, වේලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම් කරන ව්‍යාපෘතිය සහ ඉරණමඩු වාරි සංවර්ධන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා තාක්ෂණික සහය ලබා දීම.

7. වාරි සහ ඉඩම් අංශයේ ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගති සහ ප්‍රතිපත්ති සමාලෝචන කමිටු සඳහා සක්‍රීයව දායක වී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ හා අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශ නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.

## <u>ධීවර :-</u>

ධීවර අංශය සඳහා 2014 වසරේ සමස්ත රාජ්‍ය ආයෝජනය රු. මිලියන 9,338 ක් වන අතර එයින් රු. මිලියන 3,619 ක් මූලධන වියදම් වේ. මෙම අංශයෙහි සංවර්ධන විභවය හඳුනාගනිමින්, රාජ්‍ය ආයෝජන වැඩපිළිවෙල මගින් දිවයින පුරා ධීවර වරාය,නැංගුරම් පලවල් හා ගොඩබෑමේ ස්ථාන නංවාලීම, ගබඩා හා වෙළඳපල යටිතල පහසුකම් සපයාදීම, ධීවර බෝට්ටු සහ ආම්පන්න සැපයීම, වෙරළබඩ මුහුදු තීරවල හා ගැඹුරු මුහුදේ ජලජීවී වගාව සහ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා මූල්‍ය සහයෝගීතාව ලබාදීම මෙන්ම නිවාස සහ සමාජීය පහසුකම් නංවාලීමද සිදුකරනු ලබයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- ව්‍යාපෘති වාර්තා 8ක් විශ්ලේෂණය කර අදාළ නිරීක්ෂණයන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කිරීම.

- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා

- 5 ක් සඳහා නිරීක්ෂණ ලබාදීම.

## 3.2 ආර්ථික යටිතල පහසුකම් හා පරිසර

### ජල සම්පාදන :-

රටේ සියළු ජනතාවට ජලය හා සනීපාරක්ෂාව අත්‍යවශ්‍ය වේ. රටේ ආර්ථික දියුණුව සඳහා එය අත්‍යවශ්‍ය සේවාවක් වන අතරම සියළුම ජනතාව හට සුරක්ෂිත ජල හා සනීපාරක්ෂක සේවාවක් සැපයීම රජයේ ප්‍රතිපත්තිය වේ. වර්ෂ 2020 වන විට රටේ සියළුම ජනතාවට සාධාරණ හා තිරසාරාත්මක ලෙස සුරක්ෂිත පානීය ජලය සැපයීම රජයේ මූලික අරමුණයි. එම අරමුණු, කරා ලඟා වීම සඳහා රජය මඟින් ප්‍රධාන උපායමාර්ග තුනක් හඳුනා ගෙන ඇති අතර ඒවා නම්, රටේ ප්‍රධාන අගනුවර හා නාගරික ප්‍රදේශ සඳහා, විශාල ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මත කරමින් එම ප්‍රදේශ වල ජීවත් වන ජනතාවට සියයට 100 ක් නළ ජලය ලබා දීම, ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති හරහා ග්‍රාමීයව ජීවත් වන ජනතාවට නළ ජලය ලබා දීමට හා ක්‍රමවත්ව ජල පරීක්ෂා සේවා ලබා දීම මඟින් ගෘහස්ථ ජනතාව, සිය පෞද්ගලික ළිං හා අනෙකුත් මූලාශ්‍ර වලින් සිය ජල අවශ්‍යතා සපුරා ගැනීමට අනුබල දීම යනාදියයි.

පහත ක්‍රියාකාරකම් මෙම අංශය මඟින් 2014 වර්ෂය තුල සිදු කර ඇත.

- අදාල රේඛීය අමාත්‍යාංශය මඟින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 17 ක් ඇගයීම් සිදු කර නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.
- ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය මඟින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 20 කට නිරීක්ෂණ සකස් කරන ලදී.
- 2014 – 2016 රාජ්‍ය ආයෝජන උපායමාර්ගය සකස් කිරීම සඳහා ජල සම්පාදන අංශයේ ආංශික උපායමාර්ග සකස් කරන ලදී.
- අංශයට අදාල ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම්, මෙහෙයුම් කමිටු රැස්වීම් හා ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් 20 කට සහභාගී වීම හා අදාල දායකත්වය ලබා දී ඇත.

### විදුලිබල හා බලශක්ති:-

රජය බල ශක්ති සුරක්ෂිතතාවය කෙරෙහි විශේෂ අවධානය යොමු කොට ඇති අතර අවම පිරිවැයකින් ජනතාව වෙත, බල ශක්ති අවශ්‍යතාවයන් සපුරාලීම රජයෙහි අපේක්ෂාවයි. ඒ සමඟම බල ශක්ති විවිධාංගීකරණය සඳහා ජලය, සූර්යයා, සුළං වැනි පුනර්ජනනීය ප්‍රභේද භාවිතා කිරීමට අපේක්ෂා කරයි.

ඒ අතරම විදුලිය සඳහා ප්‍රවේශය 100% ඉලක්ක කර බල ශක්ති සඳහා ළඟා වීම මෙන්ම පිරිවැය මත පාදක වූ මිල ප්‍රතිපත්තියක් මෙන්ම බල ශක්ති කාර්යක්ෂමතාවය සහ සංරක්ෂණය ප්‍රධාන ප්‍රතිපත්ති ලෙස සලකනු ලබයි.

<u>විදුලි බල හා බල ශක්ති අංශය මගින් ඉටුකළ විශේෂ කාර්යයන්</u>

**2014 වර්ෂය තුල අනුමත කරන ලද ව්‍යාපෘතීන්**

2014 වර්ෂය තුල ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් බල ශක්ති කේන්ද්‍රයේ එනම් විදුලිය සහ ඛණිජ තෙල් අංශයන්හි අදාල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘති 24 ක් අනුමත කරන ලදී.

මීට අමතරව 2014 වසර තුල පහත සඳහන් කාර්යයන් ද ඉටු කරන ලදී.

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිරීක්ෂණ 12 ක් ඉදිරිපත් කරන ලදී.
- බල ශක්ති කේන්ද්‍රයේ දැක්ම සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදී.
- අනුගාමී ඛණිජ තෙල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා 2015 – 2018 කාල පරාශය සඳහා ආයෝජන සැලැස්මක් සකස් කරන ලදී.

<u>**මාර්ග**</u>**:-**

ශ්‍රී ලංකාවේ ගුණාත්මක මාර්ග යටිතල පහසුකම් දර්ශකය 2008/2009 වසර වල පැවති 63 වන ස්ථානයේ සිට 2013/2014 වන විට 49 වන ස්ථානය තෙක් වර්ධනය වී ඇත. සංවර්ධනය වන ආර්ථික ක්‍රියාකාරකම් හමුවේ මහාමාර්ග ඔස්සේ සිදු කෙරෙන ප්‍රවාහන කටයුතු සඳහා ඉල්ලුම වර්ධනය වී ඇති අතර, මේ වන විට රටේ සමස්ථ දේශීය මගී ගමනාගමනයෙන් 95% ක් ද සමස්ථ භාණ්ඩ ගමනාගමනයෙන් 98% ක් ද මෙහෙයවනු ලබන්නේ මාර්ග ජාලය හරහාය.

රටේ සමස්ත මාර්ග ජාලය, ජාතික මහාමාර්ග (කිලෝ මීටර් 12,290), පළාත් මාර්ග (කිලෝ මීටර් 19,083), හා ග්‍රාමීය මාර්ග (කිලෝ මීටර් 112,200)වශයෙන් හිමිකාරිත්වය හා කළමණාකාරී වගකීම මත පදනම්ව වර්ග කර දැක්විය හැක. මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීමට සේම තුලනාත්මක ප්‍රාදේශීය සංවර්ධනයක් සඳහාද දායක වේ. සමස්ත මහාමාර්ග ජාලයම "සර්ව කාලගුණික" මාර්ග වශයෙන් සංවර්ධනය කිරීමට ඉලක්කගත කර ඇති අතර, එහිදී සියයට සියයක්ම සියලුම වර්ගයේ මාර්ග භාවිතා කරන්නන් ද ඇතුළත්ව ග්‍රාමීය ප්‍රවේශ පහසුකම් සැපයීමත්, අන්තර් පළාත් සම්බන්ධ කෙරෙමින් ඉදිවන අධිවේගී මාර්ග ඔස්සේ කාර්යක්ෂම මගී සහ භාණ්ඩ සංචලනය වීම කෙරෙහි පහසුකම් සැලසීමත් අවසාන අරමුණු වේ.

**2014 වසරේ සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්**

I. අදාළ අමාත්‍යාංශ වෙත විෂයානුකූල ක්‍රමෝපයායන් හා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කරලීම සඳහා අවශ්‍ය තාක්ෂණික යෙදවුම් සැපයීම.
II. රේඛීය අමාත්‍යාංශ සහ අදාළ ආයතන විසින් සපයන ලද නව යෝජනා ඇතුළත් කර "ව්‍යාපෘති පෙළගැස්මක්" පිළියෙළ කිරීම.
III. "බී" පංතියේ ජාතික මාර්ග පද්ධතියට හා පළාත් මාර්ග පද්ධතියට අදාළව සංකල්ප පත්‍රිකා නිර්මාණය කිරීම.
IV. කැබිනට් පත්‍රිකා 04 ක් සඳහා නිරීක්ෂණ ලබාදීම.
V. අදාළ රේඛීය අමාත්‍යාංශ මගින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 22 ක් සඳහා ඇගයීම් සිදු කිරීම.

**ප්‍රවාහන ක්ෂේත්‍රය**

මගීන් සහ භාණ්ඩ චලනයේ ප්‍රවේශයක් ලෙස ප්‍රවාහනයට ඉතා වැදගත් ස්ථානයක් හිමිවෙයි. ශ්‍රීලංකාව තුළ වඩාත් ආරක්ෂිත, ගුණාත්මක හා ඵලදායී ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය, පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සහ මහා මාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය යන අමාත්‍යාංශ 04 ක් සහයෝගිව කටයුතු කරයි.

**වරාය**

2013 වසරේ දී කොළඹ වරායට පැමිණි නැව් සංඛ්‍යාවේ අඩු වීමක් වාර්තා කළ ද වසර තුල පැමිණි බහළුම් නැව් වල දළ ටොන් නැව් භාරය සියයට 0.6 න් ඉහළ ගිය අතර මේ තුළින් විශාල නැව් වරායන් වෙත පැමිණීම පිළිබිඹු කරයි. 2013 වසරේ දී මෙහෙය වන ලද මුළු බහළුම් ප්‍රමාණය අඩි 20 ට සමාන බහළුම් ඒකක මිලියන 43 දක්වා සියයට 2.8 කින් ඉහළ ගියේය.

**ප්‍රවාහනය**

ශ්‍රී ලංකාවේ මුළු මෝටර් රථ ප්‍රවාහනයෙන් පොදු ප්‍රවාහන මාධ්‍යයන් සඳහා ආංශික දායකත්වය සියයට 60 ක් පමණ වේ. මේ අතරින් සියයට 55 ක් බස් රථ ප්‍රවාහනය නියෝජනය කරන අතර සියයට 43 ක් පුද්ගලික බස් රථ වලින් සහ සියයට 12 ක් රාජ්‍ය බස් රථ වලින් සමන්විත වේ. සමස්ත පොදු ප්‍රවාහනයේ දුම්රිය ප්‍රවාහනය සඳහා ආංශික දායකත්වය සියයට 5 ක් වන අතර දුම්රිය සේවාව මගින් වාර්ෂිකව මගීන් මිලියන 120 ක් පමණ ප්‍රවාහනය කරනු ලැබේ.

**සිවිල් ගුවන් සේවා**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ (BEA) හසුරවන ලද මගීන් සංඛ්‍යාව 2013 වසරේ දී මිලියන 7.1 සිට 2014 වසරේ දී මිලියන 7.3 දක්වා සියයට 3.28 කින් වර්ධනය විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ හසුරවන ලද මුළු ගුවන් යානා සංඛ්‍යාව 2013 වසරේ 48,416 සිට 2014 වසරේ දී 50,800 දක්වා සියයට 4.9 කින් වර්ධනය විය.

**විශේෂ අවස්ථා**

- ප්‍රවාහන අංශයට අදාල රේඛීය අමාත්‍යාංශය විසින් යොමු කරන ලද ව්‍යාපෘති වාර්තා 21 ක් ඇගයීමට ලක් කිරීම.

- රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද කැබිනට් පත්‍රිකා 10 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- ප්‍රවාහන ක්ෂේත්‍රයේ ව්‍යාපෘති ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීම.
- ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම සඳහා අදාල අමාත්‍යාංශ වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම.
- ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඉදිරි දැක්ම සැකසීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.

## <u>පරිසර</u>

රජයේ පාරිසරික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වන්නේ ඉදිරි පරම්පරාව සඳහා ස්වාභාවික උරුමය ලබාදීම, භූමිය, සත්ව හා ශාක ප්‍රජාව සමග සහයෝගයෙන් කටයුතු කළ හැකි තිරසාර සංවර්ධනයක් ඇති කිරීමයි. ඒ සඳහා අදාල පාර්ශවකරුවන් විසින් විවිධ වැඩසටහන් 2014 වසරේදී ක්‍රියාත්මක කරන ලදී. සාකච්ඡා, රැස්වීම් හා වැඩමුළු වලට සක්‍රියව දායක වෙමින් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලදී. 2014 වර්ෂය සඳහා ව්‍යාපෘති ඇගයීමේදී ප්‍රධාන පාරිසරික අභියෝගයන් වන දේශගුණ විපර්යාසයන්ට මුහුණදීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් වර්ධනය කිරිම, ජෛව විවිධත්වය සුරකීම, වායු සහ ජල දූෂණය, පස සහ සමුදුරු ඛාදනය සහ වන ආවරණය වැඩිකිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.

වර්තමාන වන ආවරණය හෙක්ටයාර මිලියන 1.95 කි. එයදළ වශයෙන් මුළු බිම් ප්‍රමාණයෙන් 28% කි.මානව සහ ස්වභාවික ක්‍රියා නිසා සිදුවන වනහරණය හේතුවෙන් දැනට පවතින වන ආවරණය සීඝ්‍ර පහත වැටීමක් පෙන්වයි. මෙය වලක්වා ගැනීම සඳහා විනාශයට ලක් වූ වනාන්තර පුනරුත්ථාපනය හා ප්‍රතිෂ්ඨාපනය කිරීම මෙන්ම තවදුරටත් මෙම වන හානිය වලක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම වැදගත් වේ.

සමාජයීය සංවර්ධනය උදෙසා ඉඩම් වෙන්කිරීම සහ අලිවාසස්ථාන ආශ්‍රිතව ඉඩම් පරිහරණ රටාව වෙනස්වීම හේතුවෙන් අලිමිනිස් ගැටුම වර්ධනය වෙමින් පවතී. පසුගිය දශක කිහිපය තුල ජනතාවට හා දේපළ වලට මෙන්ම වන අලින්ටද හානි කරමින් අලිමිනිස් ගැටුම උග්‍ර පාරිසරික ගැටළුවක් බවට පත්වී ඇත. ඒ අනුව අලිමිනිස් ගැටුම අවම වන, වනජීවීන් සුරකින හා පාරිසරික සංචාරක කර්මාන්තය වර්ධනය කළ හැකි අයුරින් 2014 වසරේදී, අලි යන එන මාර්ග සම්බන්ධ කරමින් සහ විදුලි වැටවල් ස්ථාපිත කරමින් වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

## <u>ආපදා කළමනාකරණය</u>

ආපදාවක් නොසිතූ මොහොතක සිදුවන අනතුරක් හෝ ස්වාභාවික විපතක් ලෙස සැලකෙන අතර එමගින් ජීවිත හා දේපළ වලට දැඩි බලපෑම් එල්ල වේ. අප රටෙහි සිදුවන ප්‍රධාන ස්වාභාවික ආපදාවන් ලෙස සැලකෙන්නේ ගංවතුර, නියඟ, නායයෑම්, අකුණු සැර හා දැඩි සුළං වේ. මිනිසාගේ මැදිහත්වීම, පාරිසරික හායනය, දේශගුණ විපර්යාසයන් හා සීඝ්‍ර ආර්ථික සංවර්ධනය හේතුවෙන් ස්වාභාවික ආපදාවන් සිදුවන වාරගණන වැඩි වෙමින් පවතී. ස්වාභාවික ආපදාවන් හේතුවෙන් වසරකට ආර්ථිකයට සිදුවන අලාභය එක්සත් ජනපද ඩොලර් මිලියන 50-60ක් පමණ වේ යැයි ගණන් බලා

ඇත. 2014 වසරේදී ආපදා කළමනාකරණය පිළිබඳ පුළුල් වැඩසටහනක්(2014 – 2018 ) ආරම්භ කරමින් ආපදා කළමනාකරණය ක්‍රමවත් වැඩසටහන්මය ප්‍රවේශයකට නැඹුරු කරන ලදී.

## සංචාරක

සංචාරක කර්මාන්තය දැනට ආර්ථිකයේ 6 වන විශාලතම විදේශ විනිමය උත්පාදන මාර්ගය වේ. 2014 වසරේ මෙම කර්මාන්තයේ සමස්ත විදේශ විනිමය උත්පාදනය එ.ජ.ඩොලර් බිලියන 2.2ක් විය. 2014 වසර අවසානයේදී සම්පූර්ණ සංචාරක ආගමනය මිලියන 1.5කට අධිකය.

**විශේෂ ක්‍රියාකාරකම්**

- 2014 වසරේදී පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, උද්භිදඋද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙතින් ලැබුනු මුළු ව්‍යාපෘති යෝජනා 25 කි. මෙම ව්‍යාපෘති යෝජනාවලින් 15ක් පමණක් නිර්දේශ කර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.
- 2014 වසරේදී අමාත්‍ය මණ්ඩල සංදේශ 28කට නිරීක්ෂණ යවන ලදී. මෙම සංදේශ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය, වන සංරක්ෂණ අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ වේ.
- අදාළ අමාත්‍යාංශවල පවත්වන ලද ව්‍යාපෘති යෝජනා ඇගයීමේ සාකච්ඡා කිහිපයකට සහභාගි වීම.
- පරිසර අමාත්‍යාංශයේ සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ පැවැති " 2014 අයවැය සාකච්ඡාවලට " සහභාගි වීම.
- 2013වාර්ෂික වාර්තාවට අවශ්‍ය වනජීවී, වන සංරක්ෂණ හා වෙරළ සංරක්ෂණ අංශවලට අදාළ කරුණු ලබා දීම.

## නිවාස හා නාගරික සංවර්ධනය

නිවාස හා නාගරික සංවර්ධන ක්ෂේත්‍රයට අදාළව, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා , නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය , පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, නැවත පදිංචි කිරීම්
අමාත්‍යාංශය හා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වෙමින් කටයුතු සිදු කරනු ලැබේ.

**විශේෂ ක්‍රියාකාරකම්**

- ව්‍යාපෘති යෝජනා 18 ක් ඇගයුමට ලක් කර ඉන් 05 ක් සඳහා අනුමැතිය ලබා දීම.

- අමාත්‍ය මණ්ඩල සංදේශ 33 ක් සඳහා නිරීක්ෂණ ලබා දීම

- 2015 වසර අය වැය සඳහා නිවාස අමාත්‍යාංශය මඟින් හා ශ්‍රීලංකා ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව විසින් ඉදිරිපත් කර ලද ව්‍යාපෘති යෝජනා ප්‍රමුඛතා ගත කිරීම සඳහා අදාළ සියලු ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීම.

- නිවාස හා නාගරික සංවර්ධනය සම්බන්ධයෙන් අනාගත සංවර්ධන ක්‍රමෝපායන් හා වැඩපිළිවෙළවල් ඇතුළත් කොට සංකල්ප පත්‍රිකා පිළියෙළ කිරීම.

- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂඥ කණ්ඩායමක් සමඟ ඒකාබද්ධව කොළඹ නගරය සඳහා නාගරික ප්‍රවාහන ප්‍රතිපත්තියක් පිළියෙළ කර අවසන් කිරීම.

- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, ලෝක බැංකු විශේෂඥ කණ්ඩායමක් සමඟ ඒකාබද්ධව ජාතික මට්ටමේ අවකාශයීය පරිවර්තනයක් සඳහා වන ක්‍රමෝපායන් හඳුනාගනු පිණිස සිදු කරන ලද පූර්ව අධ්‍යනයන් සඳහා මාර්ගෝපදේශයන් ලබා දීම හා අදාළ ආයතනයන් සමඟ සම්බන්ධව තොරතුරු සම්පාදනය කිරීම

## 3.3 කර්මාන්ත, තැපැල් හා විදුලි සංදේශ තොරතුරු තාක්ෂණය හා විද්‍යා තාක්ෂණ

### කර්මාන්ත අංශය

කර්මාන්ත අංශය ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ සුවිශේෂී කාර්යභාර්යයක් ඉටු කරන අතර එහි සංවර්ධනය තුලින් ආර්ථිකයේ අනිකුත් අංශ වෙත සිදුවන ධනාත්මක බලපෑම නිසාම ශක්තිමත් කාර්මික පදනමක් තිබීම ඕනෑම සංවර්ධනය වන ආර්ථිකයක අත්‍යවශ්‍ය අංගයක් ලෙස දැක්විය හැක. එම නිසා කර්මාන්ත සංවර්ධනය සඳහා වූ රාජ්‍ය ප්‍රතිපත්තිය, ඉහළ අගය එකතු කිරීමක් සහිත, උසස් තාක්‍ෂණයෙන් යුතු, ප්‍රාදේශීයව පැතිරුණු, ගෝලීයව තරඟකාරී හා විවිධාංගීකරණය වූ කර්මාන්ත අංශයක් රටෙහි බිහිකිරීම කෙරෙහි යොමු වී ඇත. ඒ අනුව කර්මාන්ත අංශය සඳහා වන ප්‍රතිපත්තිමය අරමුණු ලඟා කර ගැනීම උදෙසා කර්මාන්ත අංශය මෙහෙය වීමේ අරමුණු ඇතිව පසුගිය වසරේදී ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව පහත විස්තර කර ඇති කටයුතු වල නියලෙන ලදී.

- පහත වගුවේ දක්වා ඇති පරිදි අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

| අමාත්‍යාංශය | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ගණන |
|---|---|
| කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය | 4 |
| ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 4 |
| සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 1 |
| ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 1 |
| සමූපකාර සංවර්ධන හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 1 |

- කර්මාන්ත අංශය ආශ්‍රිත ව්‍යපෘති වාර්තා 7 ක් ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කරන ලද අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත එම නිර්දේශ දැනුම් දෙන ලදී.

- ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය කිරීම සඳහා වූ උපාය මාර්ගික සැලැස්ම සම්පාදනය කිරීම සඳහා සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව සමඟ එක් වී කටයුතු කිරීම.

- ජාතික සමූපකාර ප්‍රතිපත්තිය සැකසීම සඳහා සමූපකාර සංවර්ධන හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

- මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2013 වාර්ෂික වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දීම.

## වැවිලි

### වැවිලි කර්මාන්ත අංශය

තේ, රබර්, පොල් සහ අපනයන කෘෂි බෝග වලින් සමන්විත වන වැවිලි අංශයට රටේ ආර්ථිකයේ වැදගත් තැනක් හිමි වේ. එමඟින් සියයට 2.5 දායකත්වයක් රටේ දළ ජාතික නිෂ්පාදනයට ලබාදෙන අතර මිලියන 1.5 කට පමණ සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ලබා දී ඇත. 2014 වර්ෂයේ වැවිලි බෝග හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම රු. බිලියන 409.09 පමණ වන අතර ඒ සඳහා තේ වැවිලි අංශයෙහි දායකත්වය සියයට 52 ක් පමණ වේ.

2014 වර්ෂය තුළ, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් වැවිලි කර්මාන්ත අංශයේ ව්‍යාපෘති යෝජනා 07 ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී. තවද වැවිලි කර්මාන්ත අංශයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණය සඳහා ඉදිරිපත් වූ අමාත්‍ය මණ්ඩල සංදේශ 03 ක් සඳහා නිරීක්ෂණ යවා ඇත. දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති වලට අදාළව මෙහෙයුම් කමිටු රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම්, අයවැය සාකච්ඡා සඳහා සහභාගීත්වය දැක්වීම සහ අවශ්‍ය දත්ත ඉදිරිපත් කිරීම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂය තුළ සිදු කර ඇත.

කන්තලේ, හිගුරාන, පැලවත්ත හා සෙවනගල සීනි කර්මාන්තාසතන සතු ඉඩම් හෙක්ටයාර 27000 ක් පමණ ලංකා ෂුගර් ප්‍රයිවට් ලිමිටඩ් නම් රාජ්‍ය ව්‍යාපාරය වෙත පවරා දීමේ දී ඉඩම් ගැටළු නිරාකරණය කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යංශ ලේකම්වරුන් 07 දෙනෙකුගෙන් යුත් කැබිනට් අනු කාරක කමිටුවක් පත් කරන ලද අතර ඒ සඳහා වාර්තාවක් සකස් කිරීම හා 2013 මුදල් අමාත්‍යංශය විසින් සකස් කරන ලද වාර්ෂික වාර්තාව සඳහා “අගය දාමයන් වැඩි දියුණු කල වැවිලි කර්මාන්තයක් කරා“ යන නමින් පසුබිම් සටහනක් ද ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේ දී සකස් කරන ලදි.

## තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන

තොරතුරු තාක්ෂණය, මාධ්‍ය, තැපැල් හා විදුලි සංදේශ යන අංශවලින් තොරතුරු හා සන්නිවේදන අංශය සමන්විත වේ. තොරතුරු තාක්ෂණ සම්බන්ධ සේවා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර බාහිරකරණ (ICT/BPO) සහ දැනුම් බාහිරකරණ (ICT/KPO) යන ආදායම් උපයන කර්මාන්ත තොරතුරු තාක්ෂණ අංශයට ඇතුළත්ය.

ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය දැනුම පාදක කරගත් සේවා අංශයක් ලෙස ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය. මෙම අංශය තුළ තොරතුරු හා සන්නිවේදන පහසුකම් ඉහළ නැංවීම, තොරතුරු හා සන්නිවේදන මාධ්‍ය වෙත ළඟාවීම පහසු කිරීම, ඉ-රාජ්‍ය සේවා ප්‍රවර්ධනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට වැදගත්වන නීතිමය පසුබිම සැකසීම යන කරුණු කෙරෙහි රජය මූලික අවධානය යොමු කරන අතර පද්ධති වැඩිදියුණු කිරීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් සේවා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම තුළ පෞද්ගලික අංශය අතිශය වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අදාළ අමාත්‍යාංශ මගින් යොමු කරන ලද නව ව්‍යාපෘති යෝජනා 17 ක් ඇගයීමට ලක්කර ඇත.
- තොරතුරු තාක්ෂණ අංශය සඳහා ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛනය (Project Pipeline) සකස් කිරීම.
- ප්‍රමුඛතා අංශ පාදක කර ගනිමින් කාල සහ ප්‍රතිඵල දර්ශක සකස් කිරීම.
- විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ, තැපැල් හා ජනමාධ්‍ය අංශවල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 07 කට නිරීක්ෂණ සපයා ඇත.
- 2014 වාර්ෂික වාර්තාව සඳහා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශයෙහි උප පරිච්ඡේදය සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව සඳහා අවශ්‍ය සහාය ලබාදීම.
- ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීමේදී රේඛීය අමාත්‍යාංශ සඳහා තාක්ෂණික යෙදවුම් ලබාදීම.

**<u>තාක්ෂණ හා පර්යේෂණ</u>**

තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රය ලෝක මට්ටමට ගෙන යාම රජයේ ප්‍රධාන අරමුණක් වේ. රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි ඉහළ තාක්ෂණික කර්මාන්ත ක්ෂේත්‍රය විශාල දායකත්වයක් දක්වනු ලබයි. ඉහළ තාක්ෂණික කර්මාන්ත ප්‍රවර්ධනය තුලින් දේශීය කර්මාන්තවල ගුණාත්මකභාවය, ඵලදායීතාවය හා තරඟකාරිත්වය වැඩි කිරීමට රජය විසින් දැනටමත් අවශ්‍ය පියවර ගෙන ඇත. පසුගිය වසර කිහිපයේදී සිදුකරන ලද නැනෝතාක්ෂණය, ජෛව තාක්ෂණය වැනි ක්ෂේත්‍රයන්හී පර්යේෂණ තුලින් ආහාර සැකසීම, පටක විද්‍යාව හා පොහොර යන අංශයන්හී ප්‍රවර්ධනයක් පෙන්වා ඇත.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අදාළ අමාත්‍යාංශ මගින් යොමු කරන ලද නව ව්‍යාපෘති යෝජනා 5 ක් ඇගයීමට ලක්කර ඇත.
- තාක්ෂණ හා පර්යේෂණ අංශය සඳහා ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛනය (Project Pipeline) සකස් කිරීම.
- තාක්ෂණ හා පර්යේෂණ  අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 7 කට නිරීක්ෂණ සපයා ඇත.

- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයයේ 2014 වාර්ෂික වාර්තාව සඳහා තාක්ෂණ හා පර්යේෂණ අංශයෙහි උප පරිච්ඡේදය සැකසීම සඳහා තොරතුරු ලබා දීම.

- ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීමේදී රේඛීය අමාත්‍යාංශ සඳහා තාක්ෂණික යෙදවුම් ලබාදීම

## 3.4 සෞඛ්‍ය සංස්කෘතික, ආගමික, ජාතික ඒකාබද්ධතා හා ක්‍රීඩා

**සෞඛ්‍ය, සංස්කෘතික, ආගමික, ජාතික ඒකාබද්ධතා සහ ක්‍රීඩා :-**

**සෞඛ්‍ය**

සෙසු කලාපීය රටවල් හා සැසඳීමේ දී මෙරට සෞඛ්‍ය දර්ශක සුවිශේෂී ස්ථානයක් හිමිකරගෙන සිටියි. රජයේ දැක්මට අනුව රටේ ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබා දීම සඳහා සෞඛ්‍යසම්පන්න හා ක්‍රියාශීලි ජනතාවක් සිටීම ඉතා වැදගත්ය. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා තවදුරටත් ප්‍රමුඛතාවය දෙමින් 2014 වර්ෂයේදී ජාතික හා පළාත් සභා, දේශිය වෛද්‍ය අංශයද ඇතුළත්ව, සෞඛ්‍ය සඳහා රජය විසින් සිදු කළ ආයෝජනය රු.බිලියන 154 ක් වේ. 2014 වර්ෂය තුලදී බෝ නොවන රෝග පාලනය, මාතෘ හා ළදරු සෞඛ්‍යසේවා සහ පහසුකම් සංවර්ධනය මෙන්ම රෝග නිවාරණය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලදී. මෙසේ රාජ්‍ය ආයෝජන ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2013 වසරේදි රු.5,683 ක් වු ඒක පුද්ගල සෞඛ්‍ය වියදම, 2014 දී රු.7,448 දක්වා ඉහළ ගොස් ඇත. 2014 වසරේදි සෞඛ්‍ය සඳහා වෙන් කළ ප්‍රාග්ධන වියදම් ප්‍රධාන වශයෙන් රෝහල් සංවර්ධනය හා ප්‍රතිසංස්කරණ කටයුතු, ඖෂධ නිෂ්පාදන පහසුකම් වැඩි දියුණු කිරීම හා රෝහල් සඳහා අවශ්‍ය කරන වෛද්‍ය හා වෛද්‍ය නොවන උපකරණ මිලදීගැනීම් සඳහා යොදවනු ලැබිණි.

**අනෙකුත් කාර්යයන්**

- සෞඛ්‍ය අංශය සංවර්ධනයට අදාළ ව්‍යාපෘති වාර්තා 16 ක් ඇගයීමට ලක් කළ අතර, ඒ සම්බන්ධ නිර්දේශ, මූල්‍ය සම්පාදනය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවටත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ රේඛිය ආයතන වලටත් ඉදිරිපත් කරන ලදී.
- සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 24 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- "පස් අවුරුදු ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම 2013-2017"ඉදිරි සංශෝධන සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සහ සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පවත්වන ලදී.
- සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය යන අමාත්‍යාංශ විසින් සංවිධානය කරන ලද, ප්‍රගති සමාලෝචන හා මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගි වන ලදී.
- අමාත්‍යාංශයෙන් සහ අදාළ ආයතනයන්ගෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.

**ආගමික, සංස්කෘතික, ජාතික උරුමයන් සහ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධ අංශය**

මෙම අංශය අමාත්‍යාංශ 04 කින් සමන්විත වේ. එනම් බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය සහ ජාතික භාෂා

හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය වශයෙනි. මෙම අමාත්‍යාංශ 04 යටතේ ආවරණය වන ක්ෂේත්‍රයන් වනුයේ බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා මුස්ලිම් ආගම්, පුරාවිද්‍යාව,

ජාතික කෞතුකාගාරය, ජාතික ලේඛණාගාරය, ජන කලාව සහ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතාවයන්ය.

**<u>විශේෂිත ක්‍රියාකාරකම්</u>**

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 10ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- ව්‍යාපෘති වාර්තා 15ක් ඇගයීමට ලක් කිරීම.
- 2013 වාර්ෂික වාර්තාව සැකසීම සඳහා දායකත්වය ලබා දීම.
- සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ පස් අවුරුදු සැලැස්ම සැකසීම සඳහා දායකත්වය ලබා දීම.

## 3.5 අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධනය

**<u>අධ්‍යාපන</u>**

නිරන්තරයෙන් වෙනස්වන, ගෝලීයකරණය වූ දැනුම පාදක කොටගත් ආර්ථිකයක අභියෝග ජය ගැනීමට අවශ්‍ය නිපුණතාවයන්ගෙන් අනාගත පරපුර සවිබල ගන්වමින්, දැනුමේ ආර්ථිකයක් ඇති කිරීමේ දැක්මට අනුකූලව යමින්, 2014 වසරේදී අධ්‍යාපන අංශය සුවිශේෂී ජයග්‍රහණ අත් පත් කර ගැනීමට සමත් විය.

ශ්‍රම වෙළඳපොලේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි අධ්‍යාපන විෂය නිර්දේශය විවිධාංගීකරණය කිරීමේ අරමුණින්, අ. පො. ස. උසස් පෙළ සඳහා තාක්ෂණික විෂය ධාරාව හඳුන්වා දීම අධ්‍යාපන අංශයේ ප්‍රධාන සන්ධිස්ථානයක් විය. තාක්ෂණික විෂය ධාරාව 2013 වසරේදී හඳුන්වා දුන් අතර, දැනට සිසුන් 32,500 ක් පමණ තාක්ෂණික විෂය ධාරාව හදාරති. තවද, ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීමේ අරමුණින්, ද්විතියික පාසැල් සංවර්ධනය සහ ප්‍රාථමික හා ද්විතියික පාසැල් අතර ජාල සම්බන්ධතාවක් ඇති කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කෙරිණ.

**2014 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්**

- අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ පැවති අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරි මග පිළිබඳ සාකච්ඡා කිරීමේ රැස්වීම් සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ පැවති තාක්ෂණික විෂය ධාරාව හදාරන සිසුන් විශ්ව විද්‍යාලවලට ඇතුළත් කිරීම පිළිබඳ රැස්වීම් සඳහා සහභාගී වීම

- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම තවදුරටත් පුළුල් කිරීම සඳහා වන "ජාතික ඉ-ඉගෙනුම් පද්ධතිය ද ඇතුළුව සාමාන්‍ය අධ්‍යාපනය සඳහා පරිපූර්ණ තොරතුරු තාක්ෂණ ක්‍රමෝපායක් ස්ථාපනය කිරීම සඳහා පළාත් හා කලාප මට්ටමින් තොරතුරු තාක්ෂණ කේන්ද්‍රස්ථාන ස්ථාපනය කිරීම" ව්‍යාපෘතිය ආරම්භ කිරීම හා සම්බන්ධ වැඩමුළු හා රැස්වීම්වලට සහභාගී වීම.

- විශ්වවිද්‍යාල නගර සංවර්ධන වැඩසටහන් ආදී වැඩසටහන් හා ව්‍යාපෘති නිර්මාණය කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට සහාය දැක්වීම සහ එම ව්‍යාපෘති යෝජනා සැකසීම සඳහා අදාළ පාර්ශ්වයන් සමග විශේෂ රැස්වීම් සංවිධානය කිරීම.

- පළාත් මට්ටමින් පාසැල්වල පවතින යටිතල පහසුකම් හා මානව සම්පත් අවශ්‍යතා පිළිබඳ රැස්වීම් සංවිධානය කිරීම සහ පළාත් අධ්‍යාපන බලධාරීන්ගෙන් ලබාගන්නා ලද ඒ පිළිබඳ දත්ත ඇතුළත් වාර්තා අයවැය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා යොමු කිරීම.

- 2014 දෙසැම්බර් මස ඇති වූ ගංවතුර හා නායයෑම් තත්ත්වයෙන් හානියට පත් වූ පාසැල් පිළිබඳ වාර්තාවක් සැකසීම සහ එම පාසැල් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ලබා ගැනීම සඳහා යොමු කිරීම.

- අධ්‍යාපන අංශයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක කෙරෙන අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන, විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපනය, දැනුම් සමාජයක් සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘති පිළිබඳව මෙරටට පැමිණෙන නියෝජිත කණ්ඩායම් සඳහා රැස්වීම් සංවිධානය කිරීම හා ඒවාට සහභාගී වීම

- අමාත්‍යාංශයෙන් සහ අදාළ ආයතනයන්ගෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.

- අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන යන අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 54ක් සහ ප්‍රතිපත්ති සම්බන්ධ පත්‍රිකා සඳහා නිරීක්ෂණ සැපයීම.

- අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අංශයේ නව ව්‍යාපෘති සහ වැඩසටහන් 79 ක් ඇගයීම.

## නිපුණතා අධ්‍යාපන අංශය

රටෙහි ඉහළ ආර්ථික සංවර්ධනක් සඳහා ඉහළ නිපුණතාවයකින් යුක්ත ශමබලකායක් සිටීම අවශ්‍ය වේ. එබැවින් වසර 2020 වන විට ජාතික වෘත්තීය සුදුසුකම් සහිත 175,000 ක්ද ඇතුළුව වසරකට කිසියම් හෝ නිපුණතාවයකින් යුක්ත තරුණ, තරුණියන් 250,000 ක් බිහිකිරීම රජයේ අරමුණ වේ.

- ව්‍යාපෘති වාර්තා හතක් ඇගයීමට ලක්කර ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබේ. ඊට අදාල නිරීක්ෂණ එකී ආයතන, විදෙස් සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබේ.

- යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩලය සංදේශ 13 ක් සඳහා නිරීක්ෂණ ලබා දී තිබේ.

- නිපුණතා අංශයේ සංවර්ධන වැඩසටහන 2014 - 2020 ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳවත්, එක් එක් නිපුණතා සංවර්ධන ආයතනයන්හි ක්‍රියාත්මක සැළසුම් ප්‍රතිශෝධනයට ලක් කිරීම සඳහාත් නිපුණතා සංවර්ධන ආයතනයන්හි නිලධාරීන් සමඟ සාකච්ඡා වාර කීපයක් පැවැත්වීම

- නිපුණතා අධ්‍යාපන පද්ධතියෙහි අර්ථවත් වෙනසක් ඇති කිරීම සඳහා රාජ්‍ය අංශයේ විවිධ අමාත්‍යාංශ යටතේ ඇති විවිධ නිපුණතා සංවර්ධන ආයතන සමඟ හා සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාකර එම ආයතනයන් විසින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාකාරකම් හඳුනාගැනීමටත්, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන වියදම 2015 අයවැය ඇස්තමේන්තුව තුළට ඇතුළත් කිරීමත් සිදු කරන ලදී.

- ජාතික නිපුණතා අංශ සංවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීමත්, මෙම අංශයේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන ප්‍රතිසංස්කරණය කිරීමත්, පුද්ගලික හා රාජ්‍ය අංශයේ නිපුණතා සංවර්ධන ආයතන හා කර්මාන්ත අංශයේ පාර්ශවකරුවන්ගේ සක්‍රිය දායකත්වය මෙම අංශයේ දියුණුව සඳහා ලබා ගැනීමේ අරමුණින් නිපුණතා අංශ සංවර්ධන වැඩසටහන සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුවේ ප්‍රථම රැස්වීම පැවැත්වීමට අදාල කටයුතු සිදු කිරීම.

- ජාතික මානව සම්පත් හා රැකි රක්ෂා ප්‍රතිපත්තිය සඳහා වන ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධව කටයුතු කරන ගරු ඇමතිතුමා (මානව සම්පත්) ගේ කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමත් මෙම වැඩසටහන මෙහෙයුම්කරණය සඳහා වන පරිගණක මෘදුකාංග පද්ධතියක් සකස් කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ මුල්‍ය
- ආධාර ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු පිළියෙල කිරීම.

## 3.6 සාර්ව ආර්ථික අංශය

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම, පවත්නා සාර්ව ආර්ථික ප්‍රශ්න හා ගැටළු හඳුනා ගැනීම, සමාලෝචනය හා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සාර්ව ආර්ථික සැලසුම් අංශයේ වගකීම වේ. මෙම අංශය මගින් දළ ජාතික නිෂ්පාදනය, උද්ධමනය හා ගෙවුම් ශේෂය ආදි සාර්ව ආර්ථික විචල්‍යයන් හා බැඳුණු කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි. ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය යටතේ ශ්‍රී ලංකාවේ සැලසුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා යෙදවුම් - නිමැයුම් වගු සහ ඡායා මිල සැකසීම සඳහා වූ රැස්වීම් සම්බන්ධිකරණය කිරීමද මෙම අංශය මගින් සිදුකරනු ලැබීය.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 03 ක් සඳහා නිරික්ෂණ ඉදිරිපත් කර ඇත.
- මුදල් අමාත්‍යාංශයේ 2013 වාර්ෂික වාර්තාවේ අදාළ අංශයන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සපයන ලදි.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2015-2017 (ආංශික සටහන්) සකස් කිරීම.
- මධ්‍යකාලීන ප්‍රාග්ධන අයවැය රාමුව 2015-2017 සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.
- ප්‍රධාන සාර්ව ආර්ථික හා ආංශිය ඉලක්ක 2015-2017 සැකසීම.
- ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය යටතේ ශ්‍රී ලංකාවේ සැලසුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා යෙදවුම් - නිමවුම් වගු සහ ඡායා මිල සැකසීම සඳහා වූ රැස්වීම් සම්බන්ධිකරණය කිරීම.
- යෙදවුම් නිමවුම් වගු සම්බන්ධයෙන් වන වැඩමුළුව පැවැත්වීම.
- සංවර්ධන සහයෝගිතා ආයතන සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- විවිධ රටවලින් හා ආයතන නියෝජනට කරමින් පැමිණෙන විදේශ නියෝජිතයන් සඳහා අවශ්‍ය රැස්වීම් සම්බන්ධීකරණය කිරීම

## 3.7 ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ අංශය

### සමාජ ආරක්ෂණ අංශය

සමාජ ආරක්ෂණ අංශය ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, සමාජ සේවා අමාත්‍යාංශය හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වෙමින් කටයුතු සිදු කරනු ලැබේ. මෙම අංශය සඳහා 2014 වසරේ සමස්ථ රාජ්‍ය ආයෝජනය - රු. මිලියන 1,399 කි. මෙහිදී ආබාධිත පුද්ගලයන් හා වැඩිහිටි පුද්ගලයන් සඳහා ලබා දෙනු ලබන දීමනාවන් විශේෂ තැනක් ගනී.

ශ්‍රී ලාංකික සමාජයේ ප්‍රජා විද්‍යාත්මක හා සමාජීය මානයන් සංවර්ධනයත් සමඟ කැපී පෙනෙන ලෙස වෙනස් වෙමින් පවතී. මෙම වෙනස් වීම නිසා ළමුන්, වරප්‍රසාද නොලත් කාන්තාවන්, වැඩිහිටියන්, ආබාධිතයින් වැනි ජනගහනයේ ඇතැම් කණ්ඩායම් වල පීඩාවට ලක් වීමේ හැකියාවන් වර්ධනය කළ ද, විශේෂිත මැදිහත් වීම් හරහා මෙම කණ්ඩායම් වල ජීවන තත්ත්වය නඟා සිටුවීමට හා ඔවුන් සමාජ ප්‍රවාහයට එක් කිරීම උදෙසා පවුලේ සුභසාධනය නංවාලීමට ඉහත අමාත්‍යාංශය සමඟ එක් වී අවශ්‍ය ප්‍රතිපත්තිමය හා වැඩසටහන් සකස් කිරීම සඳහා දායකත්වය ලබා දෙන ලදී.

### විශේෂ ක්‍රියාකාරකම්

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 11 කට හා ව්‍යාපෘති යෝජනා 11 සඳහා අවශ්‍ය නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

- 2013 මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ අදාල අංශයන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සපයන ලදී.

- සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම.

- ජාතික පූර්ව ළමා සංවර්ධන වැඩසටහන "National Early Children Development Programme 2015 – 2020" සකස් කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ගික සැලැස්ම (Strategic Frame Work) සකස් කිරීම.

- අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු විසින් මෙහෙයවන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

## ප්‍රාදේශීය සංවර්ධනය

පසුගිය දශකය තුල ක්‍රියාත්මක වූ ග්‍රාමීය සංවර්ධන ප්‍රවෙශයන්ගේ පැවති අසමානතා සහ දුර්වලතා අවම කරමින් වර්තමාන රජයේ සංවර්ධන ක්‍රියාවලිය මේ වනවිට පවුල,ගම, නගරය, සහ කලාප එකිනෙකයා කරමින් එම කලාප මූලික ආර්ථිකය සහ ජාත්‍යන්තරය සමඟ සම්බන්ධ කරමින් ඒකාබද්ධ ග්‍රාමීය ප්‍රවේශයක් සඳහා යොමු වී ඇත. දේශීය සම්පත් විභවයන් යොදාගනිමින් කලාපීය සංවර්ධන ක්‍රියාදාමය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම නව ග්‍රාමීය සංවර්ධන උපායමාර්ගය වේ. මෙම රාමුව තුල, දේශීය සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින් විවිධ සංවර්ධන ප්‍රවේශයන් අතර මනා සංයෝජනයක් ඇතිකරමින් සංවර්ධනය ඉදිරියට ගෙනයාම සඳහා රජයේ නොපසුබට දායකත්වය ලබාදී ඇත.

එබැවින් රජයේ සංවර්ධන සැලැස්ම තුල සියලුම කලාප එකම සංවර්ධන තලයකට ගෙන එමින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමටත්, කලාප අතර අන්තර් සබඳතාවය ඉහල නැංවීමටත්, කලාප අතර පවතින අසමානතා අවම කිරීමටත්, එම කලාප ජාතික ආර්ථිකය හා ඒකාබද්ධ කිරීමටත් ප්‍රමුඛතාවය හිමි වී ඇත. මෙම අරමුණු ඉටුකරලීමට ග්‍රාමීය ආර්ථිකය කේන්ද්‍ර කර ගනිමින් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අතරින් දිවි නැගුම, ගම නැගුම, පුර නැගුම සහ ප්‍රාදේශිය සංවර්ධන වැඩසටහන් හා ඒ ඒ පළාතට සුවිශේෂී වූ සංවර්ධන විභවයන් හඳුනා ගනිමින් ක්‍රියාත්මක වූ හා ප්‍රාදේශිය ආර්ථිකය නංවාලීමේ ප්‍රමුඛ වැඩසටහන් වේ. එමෙන්ම ග්‍රාමීය ජනතාවගේ කෘෂි නිෂ්පාදන සඳහා වෙළඳපල ප්‍රවේශයන් වැඩි දියුණු කිරීමේ අරමුණින් ගබඩා පහසුකම් පද්ධතිය පුළුල් කිරීමට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

### විශේෂ කාර්යයන්

- ප්‍රාදේශීය හා ග්‍රාමීය සංවර්ධනයට අදාලව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 08 ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලද අතර ව්‍යාපෘති යෝජනා 09 ක් සඳහා ඇගයීම් වාර්තා ඉදිරිපත් කරන ලදී..

## 3.8 රාජ්‍ය කළමනාකරණය

කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය සේවය තුළ ක්‍රමික වර්ධනයක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ . පෞද්ගලික අංශය සංවර්ධන කාර්යයේ යෙදවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම තුලින් රාජ්‍ය අංශය කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටුකරනු ලබයි . මේ නිසා ඵලදායි හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය අංශයේ මානව හා ප්‍රාග්ධන යන දෙකෙහිම ධාරිතා වර්ධනය ඉතා වැදගත් වේ . පසුගිය වසර තුළ රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව පහත සඳහන් පරිදි දායක වී ඇත.

- ව්‍යාපෘති යෝජනා 26 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇති අතර නිර්දේශ කිරිමේ ලිපි විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යවන ලදී.

- රාජ්‍ය කළමනාකරණ අංශයට අයත් විවිධ අමාත්‍යාංශ වලින් ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ 18 ක් සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදි.
- අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් මෙහෙය වන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා එම ආයතන වල ප්‍රගතිය සඳහා අවශ්‍ය උපදෙස්ලබාදීම.
- මධ්‍යකාලීන ප්‍රාග්ධන අයවැය රාමුව 2015-2017 සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.
- ප්‍රතිපත්ති සහ උපායමාර්ග සැකසීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත සහාය ලබාදීම.

## 4. සංවර්ධන තොරතුරුමධ්‍යස්ථානය

<u>පුස්තකාල සංවිධානය</u>

- පිටතින් ලැබෙන සියළුම පොත්පත්, ලිපිලේඛන පුස්තකාලයට අත්කර ගැනීම සහ පරිශීලනයට පහසුවන ලෙස වර්ග කිරීම.
- සඟරා අංශය වැඩිදියුණු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ පහසුව සඳහා ලිපිලේඛන ක්‍රමවත්ව සැකසීම.
- පොත් එකතුව නැවත ක්‍රමානුකූලව සැකසීම

- <u>**බොදාහැරීම්, විමසීම් සහ විමර්ශන සේවා**</u>

- තොරතුරු අවශ්‍යතා විමසීම් ගැන කටයුතු කිරීම.
- පරිගණක දත්ත උපයෝගී කරගෙන තොරතුරු ගවේශන සැකසීම.
- තොරතුරු ප්‍රවර්ධනය සඳහා පරිගණක භාවිතා කොට බෙදා හැරීමට කටයුතු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ අවශ්‍යතා අනුව පුවත්පත් ලිපි සඟරා සුපරීක්ෂණය කිරීම.

<u>අනෙකුත් පුස්තකාල සමඟ සම්බන්ධීකරණය</u>

- වාර සඟරා ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.
- සම්මත ක්‍රියාපටිපාටීන් අනුගමනය කරමින් ජාතික පුස්තකාලය සහ ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලද පුස්තකාල ජාලයන්හි විවිධ කාර්යයන්ට දායකවීම.
- අන්තර් පුස්තකාල හුවමාරු ක්‍රමය පවත්වාගෙන යාම.

**දේශීය තොරතුරු ජාලයන්ට සම්බන්ධවීම**

- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය (**[www.intranet.mo.gor.lk](www.intranet.mo.gor.lk).**) සඳහා නව තොරතුරු සැපයීම.
- **SLISTINET** තොරතුරු ජාලයට සහ මහ බැංකුව විසින් සම්පාදනය කරන ලද ආර්ථික සහ බැංකු පුස්තකාල ජාලයේ ( **E-BANK NET)** කාර්යයන්ට දායකවීම.
- ලංකා ජාතික පුස්තකාල ජාලය සමඟ දිගටම සම්බන්ධතා පවත්වාගෙන යාම.

## 5. මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය

**2014.12.31 දිනට කාර්ය මණ්ඩලය**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | සී.විජේවර්ධන මිය | අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | එස්.එස්.මුදලිගේ මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 03 | එම්.ගංගාදරන් මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 04 | එස් .ඩී .රත්නායක මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 05 | කේ.ඩී.එස්.ආර්.පෙරේරා මයා | අධ්‍යක්ෂ |
| 06 | එන්.විජේවීර මිය | අධ්‍යක්ෂ (මුදල්) |
| 07 | එන්.යූ.එන්.මෙන්ඩිස් | අධ්‍යක්ෂ |
| 08 | යූ.එන්.මල්ලවාරච්චි මයා | අධ්‍යක්ෂ |
| 09 | සී.සේනානායක මිය | අධ්‍යක්ෂ |
| 10 | ටී.ජ්.ඩී.ඩී.ප්‍රේමරත්න මයා | අධ්‍යක්ෂ |
| 11 | ටී.එම්.ජේ.බණ්ඩාර මයා | අධ්‍යක්ෂ |
| 12 | එම්.එෆ්.මුබාරක් මයා | අධ්‍යක්ෂ |
| 13 | පී.එච්.චන්දිමා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 14 | ඩී.පී.නිහරේපොල මිය | සහකාර අධ්‍යක්ෂ |
| 15 | ආර්.කේ.එම්.එන්.පලිපාන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 16 | පී.එම්.එස්.ජයතිලක මයා | සහකාර අධ්‍යක්ෂ |
| 17 | කේ.එන්.පී.ජයරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 18 | ටී.එම්.ඩී.පී.තෙන්නකෝන් මයා | සහකාර අධ්‍යක්ෂ |
| 19 | ඩබ්.එල්.පී .ප්‍රනාන්දු මිය | සහකාර අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| 20 | ආර්.කේ.එල් ජාගොඩ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 21 | ටී.වයි.එල්.මුණසිංහ මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 22 | ආර්.ඩී.ඒ.මෛත්‍රීරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 23 | ජී.ආර්.සී.හේවාවසම් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 24 | එම්.ඒ.ජී.තුෂාරි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 25 | සී.ඩී.පීරිස් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 26 | ඩබ්.ඒ.ජේ.සී.වික්‍රමාරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 27 | ඩී.ඒ.මනෝරත්න මිය | සහකාර අධ්‍යක්ෂ |
| 28 | ඩබ්.ඒ.වල්පිට මිය | සහකාර අධ්‍යක්ෂ |
| 29 | ඩී.එච්.ආර්.ඩී.විජේවර්ධන මිය | සහකාර අධ්‍යක්ෂ |
| 30 | කේ.ජී.ආර්.ජී.ආර්.වික්‍රමවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 31 | ඩී.පී.එස්.එම්.දයාසේකර මයා | සහකාර අධ්‍යක්ෂ |
| 32 | ජී. අරුණන් මයා | සහකාර අධ්‍යක්ෂ |
| 33 | එච්.ඩී.එන්.කේ. හෙට්ටිආරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 34 | ආර්.පී.එස්.ජේ. ගුණවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 35 | කේ.බී.එස්.එස්.ප්‍රනාන්දු මයා | සහකාර අධ්‍යක්ෂ |
| 36 | වී.සී.විජේවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 37 | එල්.එච්.එම්.ආර්.බී.ලංසකාර මයා | සහකාර අධ්‍යක්ෂ |
| 38 | ආර්.ජී.පී.ද සිල්වා මයා | සහකාර අධ්‍යක්ෂ |
| 39 | යූ.ඒ.ඩබ්.එල්.සුමනසේකර මිය | සහකාර අධ්‍යක්ෂ |
| 40 | කේ.ඩී.සී.තාමරසී මිය | සහකාර අධ්‍යක්ෂ |
| 41 | ඩබ්.එම්.හංසනී මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 42 | එම්.ජී.පී.කේ.ටී.ගුණවර්ධන මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 43 | බී.ඒ.නිෂාධි ලක්ෂිලා මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 44 | පී.ඒ.එන්.අබේසේකර මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 45 | ආර්.ඒ.ඩී.ලක්ෂ්මී මිය | පරිපාලන නිලධාරිනී |
| 46 | එස්.ඩී.සී.ප්‍රියංකා මිය | සංවර්ධන නිලධාරි |
| 47 | එච්.එම්.සුධර්මා හේරත් මිය | සංවර්ධන නිලධාරි |
| 48 | එස්.ඩී.ඉලේපෙරුම ආරච්චිගේ මිය | සංවර්ධන නිලධාරි |
| 49 | එච්.එම්.ආර්.ඒ.බණ්ඩාර මයා | සංවර්ධන නිලධාරි |
| 50 | ර්.එම්.කේ.ජී.කේ.එම්.ඒකනායක මයා | සංවර්ධන නිලධාරි |
| 51 | කේ.ජී.පී.දමයන්ති මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 52 | පී.කේ.කේ.ආර්.රාජකරුණා මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 53 | ජේ.ඒ.ඩී.සී.ජයකොඩි මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 54 | ඩබ්.ඩී.පී. ප්‍රනාන්දු මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |

| | | |
|---|---|---|
| 55 | ආර්.ඒ.ඩී.කේ.රාජපක්ෂ මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 56 | කේ.එල්.ඩබ්.සී.එල්.ද සිල්වා මෙය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 57 | පී.එස්.ආර්.පීරිස් මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 58 | ඒ.ඩී.එන්. මෙලානි මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 59 | එන්.ඊ. ලියනගේ මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 60 | පී.ඩබ්.එන්.එස්. පතිරාජ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 61 | ඊ.ඒ.සී.එස්. එදිරිසිංහ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 62 | නිමල් රංජිත් හෙට්ටි ආරච්චි මයා | කා.සේ.සේ. 1 |
| 63 | යූ.උපුල් රත්නකුමාර මයා | කා.සේ.සේ. 1 |
| 64 | එම්.ඩී.රසාංජන ප්‍රනාන්දු මයා | කා.සේ.සේ. 1 |
| 65 | එම්.ඒ.එල්.නලීන් මයා | කා.සේ.සේ. 1 |
| 66 | පි.එස්. අජිත් මයා | කා.සේ.සේ. 1 |
| 67 | බී.ප්‍රියන්ත මයා | කා.සේ.සේ11. |
| 68 | ඩී.ඒ.එන්.චන්ද්‍රතිලක මයා | කා.සේ.සේ11. |
| 69 | එම්.චන්දන ප්‍රදීප් මයා | කා.සේ.සේ11. |
| 70 | එම්.පී.ආර්.රත්නායක මයා | කා.සේ.සේ11. |
| 71 | ඒ.එම්.ආර්.එස්.ඩී.කුමාර මයා | කා.සේ.සේ11. |
| 72 | ජී.එස්.රෝහණ මයා | කා.සේ.සේ11. |
| 73 | පී.සමන් කුමාර පෙරේරා මයා | කා.සේ.සේ11. |
| 74 | කේ.කේ.සී.කරස්නාගල මයා | කා.සේ.සේ11. |
| 75 | ඩබ්.එම්.ජිනදාස මයා | කා.සේ.සේ11. |
| 76 | ඩබ්.එස්.යූ.කේ. සිල්වා මයා | කා.සේ.සේ11. |
| 77 | එම්.ඒ.එස්.කේ.ජයවර්ධන මයා | රියදුරු 1 |
| 78 | කේ.වී.ඩී.ඒ.පී.කරවිට මයා | රියදුරු 1 |
| 79 | ඒ.විජේතුංග මයා | රියදුරු 1 |
| 80 | ඒ.එම්. ලලිත් දීපාල් මයා | රියදුරු 1 |
| 81 | එස්.ජයසූරියර් මයා | රියදුරු 11 |
| 82 | පී.එස්.ආනන්ද මයා | රියදුරු 11 |
| 83 | පී.ඩී.ඩී.පුෂ්පකුමාර මයා | රියදුරු 11 |
| 84 | ඩබ්.එම්.එන්. කරුණාතිලක මයා | රියදුරු 11 |
| 85 | ඩී.එම්.ඩී.ශිරෝන් මයා | රියදුරු 11 |
| 86 | ඩී.බී.දිසානායක මයා | රියදුරු 11 |
| 87 | ඩී.ජී.බැසිල් සමන්ත මයා | රියදුරු 11 |
| 88 | ඊ.ඒ.එස්.එස්. එදිරිසිංහ මයා | රියදුරු 11 |
| 89 | ජේ.ජී.යූ. විමලසිරි මයා | රියදුරු 11 |

**2014 වර්ෂයේ නව පත්වීම්**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 14 | ඊ.ඒ.සී.එස්. එදිරිසිංහ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |

**2014 වර්ෂයේ ස්ථාන මාරුවී පැමිණි නිලධාරින්**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | පී.ඩබ්.එන්.එස්. පතිරාජ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 02 | ඒ.ඩී.එන්. මෙලානි මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 03 | එන්.ඊ. ලියනගේ මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 04 | ඒ.එම්. ලලිත් දීපාල් මයා | රියදුරු 1 |
| 05 | ඊ.ඒ.එස්.එස්. එදිරිසිංහ මයා | රියදුරු 1 |
| 06 | පි.එස්. අජිත් මයා | කා.සේ.සේ. 1 |
| 07 | එම්.ඒ.ජේ.කේ. මල්ලවආරච්චි මයා | කා.සේ.සේ. 1 |
| 08 | ටී.එම්.එල්.කේ. තෙන්නකෝන් මයා | කා.සේ.සේ. 111 |

**විදේශීය පුහුණු සඳහා සහභාගිවීම්**

| නම | විදේශ පුහුණුව /සම්මන්ත්‍රනය | කාලය |
|---|---|---|
| චාන්දනී විජේවර්ධන මිය<br>අධ්‍යක්ෂ ජනරාල් | - සිංගප්පූරුවේ පැවති Annual ADB Access Asia සමුළුව<br>පිලිපීනයේ පැවති Delegation to ADB Head Quarters සමුළුව<br>- ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නියෝජිතයෙකු වශයෙන් ජපානයේ පැවති සමුළුවට සහභාගි වීම | මැයි 21<br>මැයි 29 - 31<br>ජුනි 08- 13 |
| මලර්මදී ගංගාදරන් මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | - චීනයේ පැවති Seminar on the Urban Development planning and Administration for Asian Countries වැඩමුළුව<br>- පිලිපීනයේ පැවති Transport සමුළුව | මාර්තු 17 – 31<br>සැප්තැම්බරි 15-19 |

| | | |
|---|---|---|
| එස් එස් මුදලිගේ මහතා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | - කසකස්තානයේ පැවති The 47th Annual Meting of the Asian Developing Bank වැඩසටහන<br>- ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති Twenty Governing Board meting of SDC (SAARC) වැඩසටහන<br>- නේපාලයේ පැවති South Asia Sub Regional Economic Cooperation Trade Facilitation and Transport Working Group and Energy Working Group Meeting to be held වැඩසටහන | මැයි 2 - 5<br>සැප්තැම්බර් 4 - 5<br>නොවැම්බර් 4 – 5 |
| ජේ.එම්.එස්.ඩී. රත්නායක මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | - නේපාලයේ පැවති Workshop on Post 2015 Developing Agenda SAARCවැඩමුළුව<br>- මැලේසියාවේ පැවති Indian Ocean Rim Association (IROA) Dialogue Event – Paths Woman's Economic Empowerment වැඩමුළුව<br>- කටාර් හි First Meeting of the Sri Lanka-Qatar joint Committee Economic , Commercial & Technical Cooperation වැඩමුළුව | සැප්තැම්බර් 26 -28<br>අගෝස්තු 17 -19<br>සැප්තැම්බර් 14-15 |
| ඩබ්.කේ නිශාන්ති මෙනවිය<br>අධ්‍යක්ෂ (ගිණුම්) | චීනයේ පැවති Shanghai International Program for Dev. Evaluation (SHIPDET)වැඩමුළුව | ඔක්තෝම්බර් 13-24 |
| එන්.යූ.එන් නිෂාන් මෙන්ඩිස් මහතා<br>අධ්‍යක්ෂ | මැලේසියාවේ පැවති Training Programme on Capacity Building SLAS Class1 Second Country Study Visit වැඩසටහන | නොවැම්බර් 09 – 21 |
| එම්.එෆ්.ඒ. මුබාරක් මහතා<br>අධ්‍යක්ෂ | - කටාර්හි පැවති Sustainable urban Planning පුහුණු වැඩමුළුව<br>- ජපානයේ පැවති National Government Administration for Senior Officials පුහුණු වැඩමුළුව | මාර්තු 3-6<br>අගෝස්තු 31 -10 |
| ටී.ඒ.ඩී. ඩී. ප්‍රේමරත්න මහතා<br>අධ්‍යක්ෂ | - චීනයේ පැවති Seminar on Official Development Assistance Officials from South Asian Countries වැඩසටහන | මැයි 12-23 |
| ටී.එම්.ජේ. බණ්ඩාර මහතා<br>අධ්‍යක්ෂ | - නේපාලයේ පැවති Workshop on Post 2015 Developing Agenda SAARCවැඩසටහන | සැප් 26-28 |
| සී.සේනානායක මිය<br>අධ්‍යක්ෂ | - ඉන්දියාවේ බැංගලෝරයේ පැවති Regional consultation on multispectral policies for prevention and control of non communicable diseases in the South –East Asia Region, වැඩමුළුව | අගෝස්තු 18 – 20 |

| | | |
|---|---|---|
| | - පිලිපීනයේ පැවති Conference on Measuring and Achieving Universal Health Coverage with ICT in Asia and pacific - සමුළුව | දෙසැම්බර් 2 – 3 |
| කේ.ඩී.එස් .ආර්. පෙරේරා මහතා<br>අධ්‍යක්ෂ | ඉරාකයේ පැවති Visa for Sri Lanka Delegation on Standards, Quality Control, Census, Statistics and Other Related Matters වැඩසටහන | ජනවාරි 5-31 |
| යූ.එන් මල්ලවආරච්චි මහතා<br>අධ්‍යක්ෂ | - චීනයේ පැවති Seminar on Infrastructure Construction and Planning for Sri Lanka වැඩසටහන<br><br>- ජපානයේ පැවති Training Course on Climate Change Impacts and Mitigation Efforts in the Transportation වැඩසටහන | මාර්තු 06-26<br><br>සැප්තැම්බර් 23 – 25 |
| චන්දිමා පුංචිහේවා මිය<br>සහකාර අධ්‍යක්ෂ | - තායිලන්තයේ පැවති Seventieth Session of ESCAP<br>(Phase 1)United nation සමුළුව<br>- තායිලන්තයේ පැවති Seventieth Session of ESCAP (Phase 11)<br>United nation සමුළුව | මැයි 23<br><br>අගෝස්තු 4-6 |
| පී.එම්.එස් ජයතිලක මයා<br>සහකාර අධ්‍යක්ෂ | - තායිලන්තයේ පැවති Regional inception Workshop on Risk sensitive investment planning<br>- මාලදිවයිනේ පැවති training course on Environmental Valuation Methods<br>- තායිලන්තයේ පැවති 2nd Regional Workshop on Risk Sensitive Investment planning | අප්‍රේල් 25<br><br>ඔක්තෝම්බර් 15-17<br><br>සැප්තැම්බර් 15 – 18 |
| එම්.ඒ.ජී. තුෂාරි මිය<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Seminar on infrastructure Construction and Planning for Sri Lanka | මාර්තු 6-26 |
| ;වරුණි අප්සරා වල්පිට මිය<br>සහකාර අධ්‍යක්ෂ | - තායිලන්තයේ පැවති Grassroots Economic Development (GED) following Sufficiency Economy Philosophy (SEP)<br>- ජපානයේ පශ්චාත් උපාධි පාඨමාලාව 2015-2016 | ජුනි 9 – ජුලි 11<br><br>2014- 2016 |
| කේ.ජී.ආර්.ජී.ආර් වික්‍රමවර්ධන මයා<br>සහකාර අධ්‍යක්ෂ | - චීනයේ පැවති Seminar on Infrastructure Construction and Planning for Sri Lanka<br>- පිලිපීනයේ පැවති Action on Climate Change in South Asia | මාර්තු 6-26<br><br>සැප්තැම්බර් 09-14 |
| ටී.වයි.එල්. මුණසිංහ මෙනවිය<br>සහකාර අධ්‍යක්ෂ | සිංගප්පූරුවේ පැවති Trade in Value Added Global Value chains and Development Strategy | මැයි 6-8 |
| ඩී.ඒ.සී.ඩී. පීරිස් මිය<br>සහකාර අධ්‍යක්ෂ | කොරියාවේ පැවති Knowledge Sharing Programm (KSP) | ජුනි 20- ජනවාරි 25 |

| | | |
|---|---|---|
| ඩී.ඒ. නිහරේපොල මිය<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Seminar on Infrastructure Planning & Construction for Asian Countries | ජුලි 18- අගෝස්තු 07 |
| රජිතා කිසාගෝතමී ලංකාතිලක මිය<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Seminar on Energy Policy & Electricity Power Planning for Developing Countries | 5-25 August |
| ජී. අරුනන් මහතා<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Seminar on Economic Restructuring and Adjustment for Asian Countries | 08-28 may |
| එල්.එච්.එම්.ආර්.බී ලංසකාර මහතා . සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Seminar on Business Data Collecting Summarizing and Analyzing for Asian and<br>European Countries China | ජුනි 25- ජුලි 22 |
| කේ.ඩී. චන්දිමා තාමරසී මිය<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති International Workshop on Science, Technology and Innovation policy Research and Method | නොවැම්බර් 03- 22 |
| වී.සී. විජේවර්ධන මහතා<br>සහකාර අධ්‍යක්ෂ | පිලිපීනයේ පැවති 3rd ADB – DMC and Partners Sanitation dialogue | මැයි 27-29 |

**2014 වර්ෂයේ ස්ථාන මාරුවී ගිය නිලධාරින්**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | එම්.ඒ.එස්.දබරේරා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 02 | එස්.එම්.පී.එම්. විපුලසේන මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 03 | ආර්.එල්. වීරසේකර මයා | සහකාර අධ්‍යක්ෂ |
| 04 | ඒ.ආර්.චන්ද්‍රා පද්මිණී මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 05 | එච්.ඒ. ජෝර්ජ් නිමල් මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 06 | එම්.එස්. රණසිංහ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 07 | ඩබ්.ඩී.තුෂාර මයා | සංවර්ධන නිලධාරි 111 |
| 08 | ඩබ්.එන්.ආර්.චන්දිමා ලාලනී මෙය | සංවර්ධන නිලධාරි 111 |
| 09 | ටී. රත්නසිරි මයා | රියදුරු 11 |
| 10 | එම්.ඒ.ජේ.කේ. මල්ලවආරච්චි මයා | කා.සේ.සේ. 1 |
| 11 | ටී.එම්.එල්.කේ.තෙන්නකෝන් මයා | කා.සේ.සේ. 111 |
| 12 | කේ.එච්.සමන්සිරි මයා | රියදුරු 11 |

## 6 මූල්‍ය කාර්ය සාධනය - 2014

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වෙත ඉදිරිපත් කරනලද විසර්ජන ගිණුම්වල සඳහන් පරිදි වෙන්කරන ලද මුළු ප්‍රතිපාදන සහ මුළු වියදම ,පුනරාවර්තන සහ මූලධන වශයෙන් පහත පරිදි සාරාංශ කළ හැක.

| වැඩසටහනෙහි නම | 2013 | | 2014 | | වෙනස්වීමේ ප්‍රතිශතය ( % )2013)වර්ෂයේ සත්‍ය වියදම් මත) |
|---|---|---|---|---|---|
| | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | |
| පුනරාවර්තන | 63,662,000.00 | 61,672,281.00 | 75,251,500.00 | 73,526,902.00 | -19.22 |
| මූලධන | 99,075,000.00 | 95,685,647.00 | 98,112,500.00 | 72,142,779.00 | 24.60 |
| **එකතුව** | **162,737,000.00** | **157,357,928.00** | **173,364,000.00** | **145,669,681.00** | **7.42** |

ඉහත සඳහන් තොරතුරු අයවැය ඇස්තමේන්තුවල සඳහන් පරිදි උප ව්‍යාපෘති නුව වර්ග කර පහත සඳහන් පරිදි ඉදිරිපත් කළ හැක.

| උප ව්‍යාපෘතිය | වැඩසටහනෙහි නම (රුපියල්) | 2013 | | 2014 | | වෙනස්වීමේ ප්‍රතිශතය (2013වර්ෂයේ සත්‍ය වියදම් මත) |
|---|---|---|---|---|---|---|
| | | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | |
| | **පුනරාවර්තන** | **63,662,000.00** | **61,672,281.00** | **75,251,500.00** | **73,526,902.00** | **-19.22** |
| 0 | සාමාන්‍ය පරිපාලනය | 60,889,400.00 | 59,006,251.00 | 73,384,000.00 | 71,660,127.00 | -21.44 |
| 2 | ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික කවුන්සිලය | 2,772,600.00 | 2,666,030.00 | 1,867,500.00 | 1,866,775.00 | 29.97 |
| | **මූලධන** | **99,075,000.00** | **95,685,647.00** | **98,112,500.00** | **72,142,779.00** | **24.60** |
| 0 | සාමාන්‍ය පරිපාලනය | 7,210,000.00 | 6,854,642.00 | 4,100,000.00 | 3,536,088.00 | 48.41 |
| 2 | ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික කවුන්සිලය | 215,000.00 | 211,950.00 | 200,000.00 | 162,820.00 | 23.17 |
| 7 | නැගෙනහිර පළාතේ ජල සම්පාදන සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති කළමනාකරණය(ශ්‍රී ලංකා රජය/ජයිකා ආයතනය) | 43,200,000.00 | 41,911,950.00 | 31,716,500.00 | 31,636,414.00 | 24.51 |
| 8 | නැගෙනහිර පළාතේ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති කළමනාකරණය(ශ්‍රී ලංකා රජය/ජයිකා ආයතනය) | 32,890,000.00 | 32,874,202.00 | 28,510,000.00 | 28,256,750.00 | 14.04 |
| 12 | හදිසි ස්වභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය(ශ්‍රී ලංකා රජය/ජයිකා ආයතනය) | 5,100,000.00 | 5,098,281.00 | 3,756,000.00 | 3,754,019.00 | 26.36 |
| 13 | නැගී එන පළාත් ඉලක්ක කරගනිමින් මූලික සමාජ සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ජයිකා ආයතනය) | 810,000.00 | - | 4,200,000.00 | 4,191,688.00 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 14 | සාධාරණ හා රැකවරණයෙන් පිරි සමාජ සංවර්ධනය සඳහා වන ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩසටහන(යුනිසෙෆ් අරමුදල) | 6,650,000.00 | 6,500,000.00 | - | - | 100 |
| 15 | ප්‍රජනන සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය ජාතික මට්ටමින් පුළුල් කිරීම ශක්තිමත් කිරීම (එ.ජා.ජ.අ.) | 3,000,000.00 | 2,234,622.00 | 3,750,000.00 | 605,000.00 | 72.92 |
| 16 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා සහය වීම. | - | - | 21,880,000.00 | 0.00 | |
| **එකතුව** | | **162,737,000.00** | **157,357,928.00** | **173,364,000.00** | **145,669,681.00** | **7.42** |